සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

**නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus**

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

81 S I, II

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2017 දෙසැම්බර්**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2017 டிசெம்பர்**
**General Certificate of Education (Ord. Level) Examination, December 2017**

| | | |
|---|---|---|
| **කෘෂි හා ආහාර තාක්ෂණය** | **I, II** | **පැය තුනයි** |
| விவசாயமும் உணவுத் தொழினுட்பவியலும் | **I, II** | *மூன்று மணித்தியாலம்* |
| Agriculture and Food Technology | **I, II** | *Three hours* |

## කෘෂි හා ආහාර තාක්ෂණය I

**සැලකිය යුතුයි :**

(i) **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.
(iii) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

**1.** කලා වැවේ සිට තිසා වැවට ජලය රැගෙන යාමට ඉදිකරන ලද ජය ගඟ හෙවත් යෝධ ඇළ, අතීතයේ ශ්‍රී ලංකාවේ පැවති දියුණු වාරි තාක්ෂණයට නිදසුනකි. මෙම ඇළ ඉදිකරන ලද්දේ,
(1) වසභ රජතුමා විසිනි. (2) ධාතුසේන රජතුමා විසිනි.
(3) මහා පරාක්‍රමබාහු රජතුමා විසිනි. (4) මහසෙන් රජතුමා විසිනි.

**2.** හරිත විප්ලවය නිසා ශ්‍රී ලංකාව තුළ ඇති වූ වෙනසක් නම්,
(1) අත්තම් ක්‍රමයට වැඩ කිරීමෙන් ගොවීන් අතර එකමුතුකම තහවුරු වීමයි.
(2) කෘෂිකර්මය හා බැඳුණු ජන කලා මගින් සංස්කෘතිය පෝෂණය වීමයි.
(3) බෝගවලට කාබනික පොහොර යෙදීමට ගොවීන් පෙළඹීමයි.
(4) වැඩිදියුණු කරන ලද බෝග ප්‍රභේද වගා කිරීමෙන් අස්වනු වැඩි වීමයි.

**3.** යම් ප්‍රදේශයක වායුගෝලීය උෂ්ණත්වය ඉහළ යාමට හේතුවක් විය හැක්කේ එම ප්‍රදේශයේ,
(1) ගොඩනැගිලි බහුලව පැවතීම ය. (2) ජලාශ බහුලව පැවතීම ය.
(3) වෘක්ෂලතා බහුලව පැවතීම ය. (4) ඉහළ උච්චත්වය ය.

**4.** ශ්‍රී ලංකාවේ වගාකන්න, එම කන්නවලට වර්ෂාව ලබාදෙන මෝසම් සුළඟ සහ වර්ෂාව ලැබෙන මාස නිවැරදිව දැක්වෙන්නේ පහත වගුවෙහි කුමන පේළියෙහි ද?

| | වගා කන්නය | මෝසම් සුළඟ | වර්ෂාව ලැබෙන මාස |
|---|---|---|---|
| (1) | යල | නිරිත දිග | නොවැම්බර් සිට අප්‍රේල් දක්වා |
| (2) | යල | ඊසාන දිග | මැයි සිට සැප්තැම්බර් දක්වා |
| (3) | මහ | නිරිත දිග | මාර්තු සිට අගෝස්තු දක්වා |
| (4) | මහ | ඊසාන දිග | දෙසැම්බර් සිට පෙබරවාරි දක්වා |

**5.** ආග්නේය පාෂාණයක් වූ ග්‍රැනයිට් විපරීත වීමෙන් සෑදෙනුයේ,
(1) ක්වාට්ස් ය. (2) නයිස් ය. (3) කිරි ගරුඬ ය. (4) පෙග්මටයිට් ය.

**6.** පාංශු ජලය පිළිබඳව පහත දැක්වෙන ප්‍රකාශ අතරින් **වැරදි** ප්‍රකාශය කුමක් ද?
(1) පාංශු මහා අවකාශ අතරින් පහළට ගලා යන්නේ ගුරුත්වාකර්ෂණ ජලයයි.
(2) පාංශු ක්ෂුද්‍ර අවකාශ තුළ රැඳී පවතින්නේ කේශාකර්ෂණ ජලයයි.
(3) ජලාකර්ෂණ ජලය ශාකවලට පහසුවෙන් අවශෝෂණය කළ හැකි ය.
(4) ක්ෂේත්‍ර ධාරිතාවට පත් වූ පසක ඇත්තේ කේශාකර්ෂණ ජලය හා ජලාකර්ෂණ ජලය පමණකි.

**7.** පසෙහි කැටායන හුවමාරු ධාරිතාව ඉහළ නැංවීමට දායක වන පාංශු සංඝටක වනුයේ,
(1) රොන්මඩ හා මැටි ය. (2) මැටි හා හියුමස් ය.
(3) රොන්මඩ හා සියුම් වැලි ය. (4) රොන්මඩ හා හියුමස් ය.

[දෙවැනි පිටුව බලන්න

+94 71 800 8533 / +94 77 088 2228 WWW.PADANAMAPUBLICATION.LK

8. ගුරුමහතෙක් ගඩොල් කැටයක් පමණ විශාල පස් කුට්ටියක් පවනේ වියළෙන්නට ඉඩ හැර එය මීටර $1\frac{1}{2}$ ක් පමණ උසක සිට බිමට වැටෙන්නට සලස්වා කැඩී බිඳී යන පස් කැටිති නිරීක්ෂණය කළේ ය. මෙම පරීක්ෂණය සිදු කරනුයේ,

(1) පාංශු වර්ණය සෙවීම සඳහා ය. (2) පාංශු වයනය සෙවීම සඳහා ය.
(3) පාංශු ව්‍යුහ ආකාර සෙවීම සඳහා ය. (4) පාංශු තෙතමනය සෙවීම සඳහා ය.

9. පහත දැක්වෙන්නේ පරිසරයෙහි දක්නට ලැබෙන නිරීක්ෂණ කිහිපයකි.

A - දොළ පහරවල පතුලෙහි සුමට පෘෂ්ඨයක් සහිත පාෂාණ තිබීම
B - මුහුදු වෙරළෙහි පවතින වැලි ඉතා සියුම් වීම
C - ඇතැම් විශාල පාෂාණවල පැළුම් අතරින් ශාකමුල් ගමන් කිරීමෙන් එම පාෂාණ කැබලි වී තිබීම

මේවා අතරින් පාෂාණවල භෞතික ජීර්ණය සඳහා නිදසුන් වනුයේ,

(1) A හා B පමණි. (2) A හා C පමණි. (3) B හා C පමණි. (4) A, B හා C සියල්ල ම ය.


10. බෝගවල ජීවන චක්‍රය සම්පූර්ණ කිරීමට ගත වන කාලය, බෝග වර්ගීකරණයේ දී යොදා ගන්නා එක් නිර්ණායකයකි. ඒ අනුව වාර්ෂික බෝග පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) සෝයා බෝංචි, වී, මිරිස්, ගම්මිරිස් (2) මුලත්, වම්බටු, කැකිරි, කරවිල
(3) ගෝවා, තක්කාලි, මෑ, කුරුඳු (4) බඩ ඉරිඟු, මුං, බණ්ඩක්කා, වී

11. ඇතැම් බෝග තනි වගා වළවල් තුළ සිටුවීම නිර්දේශ කරනු ලබන අතර වළෙහි විශාලත්වය බෝගයේ වර්ගය අනුව වෙනස් වේ. කෙසෙල් සිටුවීම සඳහා නිර්දේශිත වගා වළක විශාලත්වය සෙන්ටිමීටර,

(1) 90 × 90 × 90 ය. (2) 60 × 60 × 60 ය. (3) 30 × 30 × 30 ය. (4) 15 × 15 × 15 ය.

12. එළවළු බීජ තවාන් කිරීම සඳහා සකසන ලද, එකිනෙකට ආසන්නව පිහිටි සම්මත තවාන් පාත්ති දෙකක සිරස්කඩ පෙනුම පහත රූපයේ දැක්වේ.




ඉහත A හා B හි නිර්දේශිත මිනුම් අනුපිළිවෙළින් සෙන්ටිමීටර,


(1) 50 හා 25 කි. (2) 80 හා 40 කි. (3) 100 හා 30 කි. (4) 125 හා 50 කි.

13. පැළවල මනා වර්ධනය සඳහා තවාන් පාත්තිවල මතුපිටට යෙදීමට නිර්දේශිත තවාන් මිශ්‍රණයේ මතුපිට පස් හා කොම්පෝස්ට් අනුපාතය

(1) 1 : 1 කි. (2) 1 : 2 කි. (3) 1 : 3 කි. (4) 2 : 1 කි.

14. මෙම රූපසටහනෙන් දැක්වෙන්නේ පැළයක් නිවැරදිව සිටුවා ඇති බඳුනක සිරස්කඩ පෙනුම ය. මෙහි *c* සහ *d* මගින් සිදු වනුයේ,

(1) වල් පැළෑටි බීජ ප්‍රරෝහණය අඩු කිරීම ය.
(2) පැළෑටියට පෝෂක සැපයීම ය.
(3) අතිරික්ත ජලය වහනය වීම ය.
(4) රෝපණ මාධ්‍යයෙහි උෂ්ණත්වය ආරක්ෂා කිරීම ය.




15. ශාකවලට අත්‍යවශ්‍ය මහා පෝෂක පමණක් අඩංගු වරණය කුමක් ද?

(1) කාබන්, හයිඩ්‍රජන් හා නයිට්‍රජන් (2) කාබන්, නයිට්‍රජන් හා බෝරෝන්
(3) ඔක්සිජන්, පොස්පරස් හා ක්ලෝරීන් (4) කැල්සියම්, මැග්නීසියම් හා සින්ක්

16. බෝග වගාවේ දී ත්‍රිත්ව සුපර්පොස්පේට් පොහොර බහුලව යොදා ගැනේ. මෙම පොහොර වර්ගයේ අඩංගු පොස්පරස් ($P_2O_5$) ප්‍රතිශතය,

(1) 20% කි. (2) 27% කි. (3) 45% කි. (4) 60% කි.


17. ගොඩ ක්‍රමයට කොම්පෝස්ට් සැකසීමේ දී කාබනික ද්‍රව්‍ය වියෝජනය වේගවත් කිරීමට ඉවහල් වන ක්‍රියාකාරකමක් වනුයේ,

(1) වාතාශ්‍රය ඇතුල් නොවන සේ කාබනික ද්‍රව්‍ය ගොඩ හොඳින් වසා තැබීම ය.
(2) මාසිකව ගොඩෙහි ආවරණය ඉවත් කර ජලය ඉසිමින් ගොඩ පෙරළීම ය.
(3) දිනපතා ගොඩෙහි ආවරණය ඉවත් කර ජලය යෙදීම ය.
(4) කාබනික ද්‍රව්‍ය ලෙස වැඩි ප්‍රමාණයක් පිදුරු එක් කිරීම ය.

[තුන්වැනි පිටුව බලන්න.

+94 71 800 8533 / +94 77 088 2228 WWW.PADANAMAPUBLICATION.LK

**18.** මෙම රූපසටහනෙහි දැක්වෙන රෝග ත්‍රිකෝණයට අනුව වගා බිමෙහි ව්‍යාධිජනකයාට අහිතකර පරිසර තත්ත්ව පවත්වාගෙන යාමෙන් ශාක රෝග පාලනය කළ හැකි බව පැහැදිලි ය. මෙම උපායමාර්ගයට නිදසුනක් නම්,




(1) පාංශු ජීවාණුහරණය ය.
(2) ප්‍රතිරෝධී බෝග ප්‍රභේද වගා කිරීම ය.
(3) ආසාදිත ශාක කොටස් පිලිස්සීම ය.
(4) බෝගයේ පැළ අතර පරතරය වැඩි කිරීම ය.

**19.** ජීවන චක්‍රයේ කීට හා සුහුඹුල් අවස්ථා දෙකම බෝගයට හානිදායක වන කෘමි පළිබෝධයකු වනුයේ,
(1) අවුලකපෝරා කුරුමිණියා ය. (2) රයිනෝසිරස් කුරුමිණියා ය.
(3) කොළ හකුළන දළඹුවා ය. (4) ගොයම් පුරුක් පණුවා ය.

**20.** ක්ෂේත්‍රයේ දී මැලවීමට ලක් ව තිබූ තක්කාලි ශාකයක කඳ කපා ජල බඳුනකට දැමූ විට කැපුම් පෘෂ්ඨයෙන් උකු තරලයක් වෑස්සෙනු දක්නට ලැබුණි. මෙම රෝගී තත්ත්වයට හේතුකාරක විය හැක්කේ,
(1) දිලීරයකි. (2) බැක්ටීරියාවකි.
(3) වටපණුවෙකි. (4) වයිරසයකි.

**21.** වී බෝගයේ පීදීමේ අවස්ථාවේ සිට කරල් මේරීමේ අවස්ථාව දක්වා ගත වන දින ගණන
(1) 30 කි. (2) 45 කි. (3) 50 කි. (4) 60 කි.

**22.** ශ්‍රී ලංකාවේ දෙමුහුම් අභිජනනයෙන් නිපදවා ඇති වී ප්‍රභේද නම් කිරීමේ දී වී ප්‍රභේදයේ වයස ද සැලකිල්ලට ගෙන ඇත. මේ අනුව, Bw 351 වී ප්‍රභේදයේ වයස මාස
(1) 3 කි. (2) $3\frac{1}{2}$ කි. (3) 4 කි. (4) $4\frac{1}{2}$ කි.

**23.** පහත සඳහන් සාධක අතරින් බීජ ප්‍රරෝහණය සඳහා අත්‍යවශ්‍ය සාධක වනුයේ,
(1) කාබන්ඩයොක්සයිඩ් හා ඔක්සිජන් ය. (2) කාබන්ඩයොක්සයිඩ් හා ජලය ය.
(3) ඔක්සිජන් හා ජලය ය. (4) ජලය හා සූර්යාලෝකය ය.

**24.** සහතික කළ බිත්තර වීවල ප්‍රමිතිය පිළිබඳව පහත දැක්වෙන ප්‍රකාශ අතරින් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) ප්‍රවේණික පාරිශුද්ධතාව 98%ක් හෝ ඊට වැඩි විය යුතු ය.
(2) වී ග්‍රෑම් 500ක තිබිය හැකි උපරිම වල් පැළ බීජ ප්‍රමාණය ග්‍රෑම් 5කි.
(3) වී ග්‍රෑම් 500ක තිබිය හැකි යාන්ත්‍රිකව හානි වූ උපරිම වී බීජ ප්‍රමාණය ග්‍රෑම් 200කි.
(4) ප්‍රරෝහණ ප්‍රතිශතය 100%ක් විය යුතු ය.

**25.** පැලුම් රිකිලි බද්ධය සිදු කිරීමෙන් පසුව අනුජය පොලිතින් කවරයකින් ආවරණය කරනුයේ,
(1) අනුජයට පළිබෝධ ඇතුල් වීම වැළැක්වීමට ය.
(2) අනුජයෙන් ජලය උත්ස්වේදනය වීම වැළැක්වීමට ය.
(3) අනුජයට ජලය ඇතුල් වීම වැළැක්වීමට ය.
(4) අනුජයට සුළඟ මගින් සිදු වන හානි වැළැක්වීමට ය.

**26.** මුල් කැබලි මගින් ප්‍රචාරණය කළ හැකි බෝග වනුයේ,
(1) බතල හා මඤ්ඤොක්කා ය. (2) මුකුණුවැන්න හා කංකුං ය.
(3) අක්කපාන හා බිගෝනියා ය. (4) කරපිංචා හා දෙල් ය.

**27.** නිර්පාංශු වගාවේ දී පෝෂණ මාධ්‍ය ලෙස ශ්‍රී ලංකාවේ බහුලව යොදා ගනු ලබන්නේ,
(1) ඇලන් කූපර් මිශ්‍රණයයි. (2) ඇල්බට් මිශ්‍රණයයි.
(3) වැලි හා දහයියා මිශ්‍රණයයි. (4) කොහුබත් හා කොම්පෝස්ට් මිශ්‍රණයයි.

**28.** ගොවිපොළක එක් නිෂ්පාදන ඒකකයක අතුරු ඵල තවත් නිෂ්පාදන ඒකකයක අමුද්‍රව්‍ය ලෙස යොදා ගනිමින් එකම භූමියක් තුළ බෝග වගාව, සත්ත්ව පාලනය හා බලශක්ති නිෂ්පාදනය ආදී ක්‍රියාවලි ඒකාබද්ධව සිදු කරනු ලබන්නේ,
(1) හේන් ගොවිතැනේ දී ය. (2) සංරක්ෂණ ගොවිතැනේ දී ය.
(3) කාබනික ගොවිතැනේ දී ය. (4) සමෝධානිත ගොවිතැනේ දී ය.

[හතරවැනි පිටුව බලන්න.

PADANAMA PUBLICATION

**29.** 'පසු අස්වනු තාක්ෂණයේ' ප්‍රධාන අරමුණ නම්,
(1) අස්වනු නෙළීම සඳහා යන්ත්‍රෝපකරණ භාවිත කිරීම ය.
(2) පසු අස්වනු සාධක කළමනාකරණය මගින් අස්වනු හානිය අවම කිරීම ය.
(3) අස්වනු ප්‍රවාහනය සඳහා ප්ලාස්ටික් පෙට්ටි භාවිත කිරීම ය.
(4) අස්වනු ගබඩා කිරීමට ශීත කාමර භාවිත කිරීම ය.

**30.** පුද්ගලයකුගේ ශරීර ස්කන්ධ දර්ශකය (BMI) ගණනය කිරීම සඳහා අවශ්‍ය වන මිනුම් වනුයේ,
(1) ශරීර බර හා උස ය. (2) උපත් බර හා වයස ය.
(3) උස හා ඉනෙහි වට ප්‍රමාණය ය. (4) රුධිරයෙහි අඩංගු සීනි ප්‍රමාණය හා උස ය.

**31.** ආහාර නරක්වීම කෙරෙහි බලපාන සාධක, භෞතික, රසායනික සහ ජීවවිද්‍යාත්මක සාධක වශයෙන් බෙදා දැක්විය හැකි ය. පහත සඳහන් සාධක අතරින් ආහාර නරක් වීමට බලපාන රසායනික සාධකයක් වනුයේ,
(1) ආහාරයේ තෙතමනයයි. (2) පරිසර උෂ්ණත්වයයි.
(3) ආහාර තුළ සිදු වන එන්සයිමීය ක්‍රියායි. (4) ආහාර මත දිලීර වර්ධනයයි.

**32.** ඉතා ඉක්මනින් නරක්වනසුලු ආහාර අධි අවදානම් ආහාර ලෙස හඳුන්වයි. පහත ආහාර කාණ්ඩ අතරින් අධි අවදානම් ආහාර වර්ග පමණක් අඩංගු පිළිතුර වනුයේ,
(1) මාළු, කිරි හා මස් ය. (2) මාළු, කිරි හා පැපොල් ය.
(3) බිත්තර, මස් හා වියළි මිදි ය. (4) බත්, කේක් හා පලතුරු සලාද ය.

**33.** පහත සඳහන් ප්‍රකාශ අතරින් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) පැස්චරීකෘත කිරි සම්පූර්ණයෙන් ම ක්ෂුද්‍රජීවීන්ගෙන් තොර වේ.
(2) පැස්චරීකෘත කිරි දින 7 - 10ක් කාමර උෂ්ණත්වයේ නරක් නොවී තබා ගත හැකි ය.
(3) කිරි ජීවාණුහරණය කිරීමේ දී එහි අඩංගු සියලු ක්ෂුද්‍රජීවීන් මෙන්ම ඒවායේ බීජාණු ද විනාශ වේ.
(4) ජීවාණුහරණයේ දී කිරි අධික උෂ්ණත්වයකට භාජනය කර ක්ෂණිකව සිසිල් කර අඩු උෂ්ණත්වයක ගබඩා කරයි.

**34.** කිරි ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ ඇති කරනු ලබන ඉන්දීය ගව වර්ගයකි,
(1) ජර්සි. (2) ෆ්‍රීෂියන්. (3) සින්දි. (4) අයර්ෂයර්.

**35.** වසංගත රෝග යනු ඉතා ශීඝ්‍රයෙන් පැතිරෙන පාලනයට අපහසු රෝග වේ. ශ්‍රී ලංකාවේ පවතින ප්‍රධාන ගව වසංගත රෝගයකි,
(1) කිරි උණ. (2) ගව රක්තාශ්‍රය. (3) බුරුළු ප්‍රදාහය. (4) කිනිතුළු උණ.

**36.** ගව දෙනකගේ මද චක්‍රය දින,
(1) 21කි. (2) 30කි. (3) 285කි. (4) 305කි.

**37.** සතුන්ට ලබාදෙන ආහාරවල අඩංගු විය යුතු ප්‍රධාන පෝෂක අතරින් සතුන්ගේ වර්ධනය සහ ගෙවී ගිය පටක අලුත්වැඩියා කිරීම යන කාර්ය සඳහා වැදගත් වන පෝෂකය වනුයේ,
(1) කාබොහයිඩ්‍රේට් ය. (2) ප්‍රෝටීන් ය. (3) ලිපිඩ ය. (4) විටමින් ය.

**38.** සත්ත්ව ආහාර සලාක පිළියෙල කිරීමේ දී ප්‍රෝටීන් ලබා දීම සඳහා යොදා ගත හැකි ආහාර සංඝටකයකි,
(1) පොල් පුණ්ණක්කු. (2) සිප්පිකටු කුඩු. (3) බඩ ඉරිඟු. (4) හාල් නිවුඩු.

**39.** සත්ත්ව ආහාර දළ ආහාර හා සාන්ද්‍ර ආහාර ලෙස ප්‍රධාන වර්ග දෙකකට බෙදිය හැකි ය. ගවයින් සඳහා ලබා දිය හැකි සාන්ද්‍ර ආහාරයකි,
(1) සයිලේජ්. (2) පිදුරු. (3) තෘණ. (4) පුණ්ණක්කු.

**40.** වීදුරු මතුපිටකට කිරි සාම්පලයකින් බිංදුවක් දැමූ විට සුදු පැහැති සීමා සලකුණක් නොපෙන්වා එය ගලා ගියේ ය. මෙයින් නිගමනය කළ හැක්කේ කිරිවලට
(1) ක්ෂුද්‍රජීවීන් ආසාදනය වී ඇති බව ය. (2) ජලය මිශ්‍ර වී ඇති බව ය.
(3) වර්ණක මිශ්‍ර වී ඇති බව ය. (4) පොල්තෙල් මිශ්‍ර වී ඇති බව ය.

**

[පස්වැනි පිටුව බලන්න.

+94 71 800 8533 / +94 77 088 2228 WWW.PADANAMAPUBLICATION.LK

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**81 S I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2017 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2017 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2017

කෘෂි හා ආහාර තාක්ෂණය I, II
விவசாயமும் உணவுத் தொழினுட்பவியலும் I, II
Agriculture and Food Technology I, II

## කෘෂි හා ආහාර තාක්ෂණය II

※ **පළමුවැනි** ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළුව ප්‍රශ්න **පහකට පමණක්** පිළිතුරු සපයන්න.

**1.** වර්තමානයේ ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කරනු ලබන 'ජාතික ආහාර නිෂ්පාදන සංග්‍රාමයට' සමගාමීව එක්තරා පාසලක ගෙවත්තෙහි ආහාර බෝග වගා කිරීමටත්, පාසල් භූමියෙහි සිටුවීමට සහ අවට ප්‍රජාවට රෝපණ ද්‍රව්‍ය අලෙවි කිරීම පිණිස තවාන් පැළ නිෂ්පාදනය කිරීමටත් සැලසුම් කරන ලදී. මීට අමතරව පාසල් ගෙවත්තෙහි එළවළු බෝග වගා කිරීමට ද තීරණය විය.

(i) එළවළු බෝගවලට අමතරව පාසල් ගෙවත්තෙහි වගා කළ හැකි වෙනත් ආහාර බෝග කාණ්ඩ **හතරක්** සඳහන් කරන්න.

(ii) පැළ තවාන සඳහා සුදුසු ස්ථානයක් තේරීමේ දී සලකා බැලිය යුතු සාධක **දෙකක්** ලියන්න.

(iii) මූල මණ්ඩලයට හානි නොවන පරිදි ක්ෂේත්‍රයේ සිටුවීමට තවාන් පැළ ලබා ගැනීම සඳහා සකස් කළ හැකි තවාන් වර්ග **දෙකක්** නම් කරන්න.

(iv) තවාන් පැළ දියමලන් කැමේ රෝගය වැළඳීමෙන් වළක්වා ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග **දෙකක්** ලියන්න.

(v) ශිෂ්‍යයෙක් බෝග වගා කිරීමට අපේක්ෂිත භූමියෙන් පස් මිටක් අත්ලට ගෙන, තෙත් කර, ගුලියක් සාදා එය දෙඅත්ල මැද තබා රෝල් කිරීමට ගත් උත්සාහයේ දී එය කැඩී ගියේ ය. මෙම පසෙහි වයනය කුමක් විය හැකි ද?

(vi) බෝග වගා කර ඇති භූමියක පාංශු තෙතමනය ආරක්ෂා කර ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග **දෙකක්** සඳහන් කරන්න.

(vii) භූගත කඳන් සහිත වල් පැළෑටි වන කලාඳුරු හා ඇටවරා පාසල් භූමියෙහි බහුලව වැවී තිබුණි. මෙම වල් පැළෑටි සාර්ථකව මර්දනය කිරීමට යොදාගත හැකි රසායනික නොවන ක්‍රම **දෙකක්** සඳහන් කරන්න.

(viii) පාසල් භූමියක එක්රැස්වන කාබනික අපද්‍රව්‍ය ප්‍රයෝජනවත් ලෙස භාවිත කළ හැකි ආකාර **දෙකක්** ලියන්න.


(ix) මෙම පාසල් ගෙවත්ත සමෝධානිත ගොවිපොළක් ලෙස සංවර්ධනය කිරීමට යෝජිත නම් ඊට ඇතුළත් කළ යුතු නව අංග **දෙකක්** නම් කරන්න.

(x) සිසුන්ගේ ගෙවතුවල නිදැලි ක්‍රමයට සුළු පරිමාණයෙන් කිකිළියන් ඇති කිරීමෙන් ලැබෙන වාසි **දෙකක්** ලියන්න.

**2.** බෝග වගාවේ දී ඊට බලපාන කාලගුණික පරාමිති පිළිබඳ ව දැනුවත් වීම ඉතා වැදගත් වේ.

(i) (a) මෙම රූපසටහනෙහි දැක්වෙන උපකරණය භාවිත කරනු ලබන්නේ කුමන කාලගුණික පරාමිතියක් මැනීම සඳහා ද?

(b) මෙම උපකරණයේ *A*, *B* හා *C* යන කොටස් නම් කරන්න.




(ii) අධික සාපේක්ෂ ආර්ද්‍රතාව බෝග වගාව කෙරෙහි ඇති කරන අහිතකර බලපෑම් **තුනක්** ලියන්න.

(iii) පුෂ්ප හටගැනීමේ දී, දිවා කාලයේ දිගට ශාක දක්වන ප්‍රතිචාරය අනුව බෝග කාණ්ඩ තුනකට වෙන් කර දැක්විය හැකි ය. එම බෝග කාණ්ඩ **තුන** සඳහන් කර, ඒ පිළිබඳ ව කෙටියෙන් පැහැදිලි කරන්න.

[හයවැනි පිටුව බලන්න.

**3.** පස බාදනයට ලක්වීම, පස තද වීම, එහි භෞතික හා රසායනික ලක්ෂණ වගාවට අහිතකර වන පරිදි වෙනස් වීම ආදිය නිසා පසක් හායනය වේ.

(i) (a) පාංශු බාදන ක්‍රියාවලියෙහි පියවර **තුන** නම් කරන්න.
(b) පාංශු බාදන කාරක **දෙකක්** සඳහන් කරන්න.
(c) පාංශු බාදනය නිසා බෝග වගාවට සිදු වන අහිතකර බලපෑම් **දෙකක්** ලියන්න.

(ii) බෑවුම් වගා බිම් මතුපිටින් ජලය ගලා යාමේ වේගය අඩු කිරීම පිණිස ගත හැකි පාංශු සංරක්ෂණ ක්‍රියාමාර්ග **හතරක්** සඳහන් කරන්න.

(iii) පසක් තද වීම නිසා බෝග වගාවට ඇති වන අහිතකර බලපෑම් **දෙකක්** ලියන්න.

**4.** පළිබෝධ පාලනය සඳහා සුදුසු ක්‍රමවේද තීරණය කිරීම පිණිස කෘමි පළිබෝධයින්ගේ ජීවන චක්‍රවල ස්වභාවය සහ ඔවුන් ආහාර ගන්නා විලාසය වැදගත් වේ.

(i) කෘමි ජීවන චක්‍ර ඇසුරෙන් පූර්ණ රූපාන්තරණය හා අර්ධ රූපාන්තරණය කෙටියෙන් පැහැදිලි කර ඒ එක් එක් රූපාන්තරණයක් සඳහා උදාහරණ **දෙක** බැගින් දෙන්න.

(ii) ආහාර ගන්නා විලාසය අනුව කෘමි පළිබෝධ බෝගවලට හානි කරන ආකාර **දෙකක්** සඳහන් කර, එම හානි සිදු කරන පළිබෝධයකු බැගින් ලියන්න.

(iii) පලතුරු හා එළවළුවලට වැළඳෙන ඇන්ත්‍රැක්නෝස් රෝගයේ රෝග ලක්ෂණ **දෙකක්** හා එම රෝගය පාලනය සඳහා යොදා ගත හැකි ක්‍රම **දෙකක්** ලියන්න.

**5.** ශාක වර්ධක ප්‍රචාරණයේ දී මවු ශාකයේ විවිධ කැබලි සිටුවීම, අතු බැඳීම, බද්ධ කිරීම හා පටක රෝපණය ආදී විවිධ ක්‍රම මගින් නව පැළ නිපදවා ගැනේ.

(i) (a) ශාක බද්ධ කිරීම යනු කුමක් ද?
(b) ශාක බද්ධ කිරීමේ දී යොදා ගන්නා අනුජයෙහි ඇති අංකුර සංඛ්‍යාව අනුව ප්‍රධාන බද්ධ ක්‍රම දෙකකට බෙදා දැක්විය හැකි ය. එම බද්ධ ක්‍රම **දෙක** සඳහන් කරන්න.
(c) ශාක බද්ධ කිරීමේ දී යොදා ගන්නා ග්‍රාහක ශාකයක තිබිය යුතු වැදගත් ලක්ෂණ **දෙකක්** ලියන්න.

(ii) සූර්ය ප්‍රචාරකයක් තුළ ශාක අතු කැබලිවල මුල් ඇදීම වේගවත් ය. එයට හේතු **දෙකක්** සඳහන් කරන්න.

(iii) වර්ධක ප්‍රචාරණයේ වාසි **හතරක්** ලියන්න.

**6.** බෝගවල අවශ්‍යතා සපිරෙන පරිදි නිසි අයුරින් බිම් සැකසීම හා නිවැරදි බෝග සංස්ථාපන ක්‍රම යොදා ගැනීම මගින් වැඩි අස්වනු ප්‍රමාණයක් අපේක්ෂා කළ හැකි වේ.

(i) (a) බෝග වගාවේ දී බිම් සැකසීමේ අරමුණු **හතරක්** ලියන්න.
(b) බෝග වගාවේ දී සකසනු ලබන පාත්ති වර්ග **හතරක්** නම් කරන්න.

(ii) පහත දැක්වෙන්නේ බිම් සැකසීමේ උපකරණවල තොරතුරු පිළිබඳ අසම්පූර්ණ වගුවකි. එහි A, B, C, D, E හා F යන හිස්තැන්වලට අදාළ තොරතුරු පමණක් නිවැරදි අක්ෂරය සහිතව ඔබේ පිළිතුරු පත්‍රයෙහි ලියන්න.

| උපකරණය | උපකරණය යොදා ගන්නා බිම් සැකසීමේ පියවර | උපකරණය ක්‍රියාත්මක කිරීමට යොදා ගන්නා බලය |
|---|---|---|
| හැඩ ලැලි නගුල | උදා: ප්‍රාථමික බිම් සැකසීම | උදා: යාන්ත්‍රික බලය |
| තැටි නගුල | A | D |
| ඇලි හා වැටි දමනය (රිජරය) | B | E |
| ජපන් රොටරි වීඩරය | C | F |

(iii) බෝග සංස්ථාපනයේ දී පැළ අතර නිර්දේශිත පරතරය පවත්වා ගැනීමේ වාසි **තුනක්** සඳහන් කරන්න.

**7.** සත්ත්ව පාලනයෙන් උපරිම නිෂ්පාදනයක් ලබා ගැනීම පිණිස ගොවිපොළ සතුන්ට සුදුසු නිවාස සැපයිය යුතු වන අතර අනෙකුත් පාලන ක්‍රම පිළිබඳව ද අවධානය යොමු කළ යුතු ය.

(i) ගව නිවාසයක් සඳහා ස්ථානයක් තේරීමේ දී සලකා බැලිය යුතු සාධක **තුනක්** සඳහන් කරන්න.

(ii) (a) ගව පාලනයේ දී කෘත්‍රිම සිංචනය යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?
(b) කෘත්‍රිම සිංචනයේ වාසි **තුනක්** ලියන්න.

(iii) ඝන ආස්තරණ ක්‍රමයට කුකුළන් ඇති කිරීමේ දී අතුරණුවක් ලෙස යොදා ගන්නා ද්‍රව්‍යයක තිබිය යුතු ලක්ෂණ **තුනක්** සඳහන් කරන්න.

* * *

# 10 සහ 11 ශ්‍රේණි සඳහා ග්‍රන්ථ නාමාවලිය

## (අ.පො.ස) සාමාන්‍ය පෙළ
## 11 ශ්‍රේණිය - කෙටි සටහන්

**සිංහල මාධ්‍ය**

- [ ] 10-11 සිංහල ව්‍යාකරණ
- [ ] 10-11 සිංහල සාහිත්‍යය රසාස්වාදය
- [ ] බුද්ධ ධර්මය
- [ ] කතෝලික ධර්මය
- [ ] සිංහල භාෂාව හා සාහිත්‍යය
- [ ] සිංහල සාහිත්‍යය සංග්‍රහය
- [ ] English Language
- [ ] ගණිතය - 1
- [ ] ගණිතය - 2
- [ ] ජීව විද්‍යාව
- [ ] භෞතික විද්‍යාව
- [ ] රසායන විද්‍යාව
- [ ] ඉතිහාසය
- [ ] ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය
- [ ] භූගෝල විද්‍යාව
- [ ] පුරවැසි අධ්‍යාපනය
- [ ] පෙරදිග සංගීතය
- [ ] නර්තනය
- [ ] නාට්‍ය හා රංග කලාව
- [ ] චිත්‍ර කලාව
- [ ] තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය
- [ ] සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය
- [ ] සෞඛ්‍යය හා ශාරීරික අධ්‍යාපනය
- [ ] කෘෂි හා ආහාර තාක්ෂණය
- [ ] ගෘහ ආර්ථික විද්‍යාව

## 11 ශ්‍රේණිය - ප්‍රශ්නෝත්තර

**සිංහල මාධ්‍ය**

- [ ] සිංහල භාෂාව හා සාහිත්‍යය
- [ ] බුද්ධ ධර්මය
- [ ] ඉතිහාසය
- [ ] ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය
- [ ] පුරවැසි අධ්‍යාපනය

## Grade 11 - Short Notes

**English Medium**

- [ ] Buddhism
- [ ] Mathematics - 1
- [ ] Mathematics - 2
- [ ] Biology
- [ ] Physics
- [ ] Chemistry
- [ ] History
- [ ] Business & Accounting Studies
- [ ] Geography
- [ ] Civic Education
- [ ] ICT
- [ ] Health & Physical Education
- [ ] 10-11 English Literary (Poetry)
- [ ] 10-11 English Literary (Drama)
- [ ] 10-11 English Literary (Short Story)

## Grade 11 - Model Papers

**English Medium**

- [ ] Civic Education

## 10 ශ්‍රේණිය - කෙටි සටහන්

**සිංහල මාධ්‍ය**

- [ ] බුද්ධ ධර්මය
- [ ] කතෝලික ධර්මය
- [ ] සිංහල භාෂාව හා සාහිත්‍යය
- [ ] සිංහල සාහිත්‍යය සංග්‍රහය
- [ ] සිංහල රචනා අත්වැල
- [ ] English Language
- [ ] ගණිතය - 1
- [ ] ගණිතය - 2
- [ ] ජීව විද්‍යාව
- [ ] භෞතික විද්‍යාව
- [ ] රසායන විද්‍යාව

- ඉතිහාසය
- ඉතිහාසය රූප සටහන් අශ්‍රිත කෙටි සටහන්
- ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය - 1
- ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය - 2
- භූගෝල විද්‍යාව
- පුරවැසි අධ්‍යාපනය
- පෙරදිග සංගීතය
- නර්තනය
- නාට්‍ය හා රංග කලාව
- චිත්‍ර කලාව
- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය
- සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය
- සෞඛ්‍යය හා ශාරීරික අධ්‍යාපනය
- කෘෂි හා ආහාර තාක්ෂණය
- ගෘහ ආර්ථික විද්‍යාව
- ජපන් භාෂාව

## 10 ශ්‍රේණිය - ප්‍රශ්නෝත්තර

**සිංහල මාධ්‍ය**

- සිංහල භාෂාව හා සාහිත්‍යය
- බුද්ධ ධර්මය
- ගණිතය
- විද්‍යාව
- ඉතිහාසය
- පුරවැසි අධ්‍යාපනය
- භූගෝල විද්‍යාව
- පෙරදිග සංගීතය

## පාඩමෙන් පාඩමට මාසික ඇගයීම්

**සිංහල මාධ්‍ය**

- 10-ශ්‍රේණිය - විද්‍යාව
- 11-ශ්‍රේණිය - විද්‍යාව

## Grade 10 - Short Notes

**English Medium**

- Buddhism
- Mathematics - 1
- Mathematics - 2
- Biology
- Physics
- Chemistry
- History
- Business & Accounting Studies - 1
- Business & Accounting Studies - 2
- Geography
- Civic Education
- ICT
- Health & Physical Education

## Grade 10 - Model Papers

**English Medium**

- Mathematics
- Science
- Civic Education
- Geography
- English Activity Book
- English Work Book

## අනෙකුත් ග්‍රන්ථ

- හෙළදිව කතිකාවත - අරුණශාන්ත අමරසිංහ
- හොල්මන් අවතාර සහ යකදුරන් - අරුණශාන්ත අමරසිංහ
- සිසු-ගුරු අත්පොත නාට්‍ය හා රංග කලාව 10-11 ශ්‍රේණි සඳහා (නව විෂය නිර්දේශය) - නන්දන අල්ගේවත්ත

සියලු ම ශ්‍රේණි සඳහා කෙටි සටහන්, ප්‍රශ්න පත්‍ර කට්ටල සහ වැඩ පොත් අප සතුව තිබෙන අතර, මෙම ඕනෑම ග්‍රන්ථයක් වට්ටම් සහිත ව ඔබේ නිවසට ම ගෙන්වා ගත හැකි ය.